**ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව -2016**
**-------------------------------------------------------------**

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ vii කොටසේ 40 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම, සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වල ට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 මතය

-------

මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

------------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07ට අනුකූල නොවීම් පහත දැක්වේ.

(i) ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 1,373,579 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) මූල්‍ය ප්‍රකාශන පරිශීලකයන්ගේ තොරතුරු අවශ්‍යතාවයන් උදෙසා ක්‍රියාකාරී භාවිතයෙන් විශ්‍රාම ගන්වා ඇති දේපල පිරියත හා උපකරණවල ධාරණ අගය ගිණුම්වල හෙළිදරව් කළයුතු වුවද පිරිවැය රු. 202,811 ක් වූ වත්කම් සම්බන්ධයෙන් අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

--------------------------------------------------------------------------

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩිදියුණු කිරීමේ පනත 5 (ආ) වගන්තිය | පනතේ විධිවිධාන අනුව රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ව්‍යාපාර විසින් විද්‍යාව හා තාක්ෂණය භාවිතා කිරීම පිළිබඳව ඉකුත් වර්ෂයේ ශ්‍රී ලංකාව තුළ සිදු කරන ලද විද්‍යා හා තාක්ෂණ කටයුතු සමාලෝචන වාර්තා අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2015 වර්ෂය හා 2016 වර්ෂය වෙනුවෙන් එකී වාර්තා අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 9/2009 හා 2017 අප්‍රේල් 19 දිනැති 03/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ. | කොමිෂන් සභාවේ සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍රයක් භාවිතා කර නොතිබුණි. |

**3.** **මූල්‍ය සමාලෝචනය**

**------------------------**

**3.1** **මූල්‍ය ප්‍රතිඵල**

**--------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ මූල්‍ය ප්‍රතිඵලය රු. 826,191 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 905,677 ක් වූයෙන්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 1,731,868 ක පිරිහීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ මුළු පුනරාවර්තන ප්‍රදාන හා පුනරාවර්තන ස්වභාවයේ ප්‍රාග්ධන ප්‍රදාන පිළිවෙලින් රු. 3,761,808 කින් හා රු. 6,164,100 කින් වැඩි වී තිබුණද, ගිවිසුම්ගත සේවා වියදම රු. 2,811,497 කින් වැඩිවීම හා විද්‍යා හා තාක්ෂණ සේවා වියදම රු. 8,110,733 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ හතරක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 සහ 2010 වර්ෂවලදී අතිරික්තයන් දක්නට ලැබුණද, 2012, 2014 හා 2016 වර්ෂවලදී ඌනතාවයක් නිරීක්ෂණය විය. එසේ වුවද, සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය ගැලපීමෙන් පසු 2012 වර්ෂයේදී රු. 12,119,005 ක් වූ දායකත්වය අඛණ්ඩව වර්ධනය වී 2015 වර්ෂය අවසානයේදී රු. 15,946,234 ක් වී තිබුණද, 2016 වර්ෂයේදී රු. 11,736,194 ක් දක්වා අඩුවී තිබුණි.

**4.** **මෙහෙයුම් සමාලෝචනය**

**----------------------------**

**4.1** **කාර්යසාධනය**

**----------------**

1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 1 වන කොටසේ 5 වන වගන්තිය ප්‍රකාරව, විද්‍යාවේ හා තාක්ෂණයේ වර්ධනය සඳහා ප්‍රතිපත්ති හා සැලසුම් සම්බන්ධයෙන් ආණ්ඩුවට උපදෙස් දීම, ආර්ථික වර්ධනය ශක්තිමත් කරලීම, සෞඛ්‍ය, පෝෂණය හා දිළිඳුකම තුරන් කිරීම, අධ්‍යාපන, පුහුණු කිරීම් හා පර්යේෂණ සම්බන්ධයෙන් අවශ්‍ය මිනිස් සහ වෙනත් සම්පත් සංවර්ධනයට විද්‍යා හා තාක්ෂණය යොදා ගැනීම, පර්යේෂණ හා සංවර්ධන කටයුතුවල අරමුදල් වෙන් කිරීමට අදාලව ප්‍රතිපත්ති හා සැලසුම් සකස් කිරීම, ශ්‍රී ලංකාව තුළ විද්‍යා හා තාක්ෂණ ආයතනවල ප්‍රගතිය සමාලෝචනය කිරීම හා ඒ පිළිබඳ වාර්තාවක් වාර්ෂිකව ආණ්ඩුව වෙත ඉදිරිපත් කිරීම, ශ්‍රී ලංකා විද්‍යා හා තාක්ෂණ සම්මේලනය අවුරුදු දෙකකට වරක් කැඳවීම හා විද්‍යා හා තාක්ෂණය පිළිබඳ සාකච්ඡා කිරීමට මණ්ඩපයක් සැලසීම හා ඒ පිළිබඳව අමාත්‍යවරයා වෙත වාර්තාවක් ඉදිරිපත් කිරීම සභාවේ ප්‍රධාන කාර්යයන් වේ.

ඉහත සඳහන් කාර්යයන් ඉටුකිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව වර්ෂය තුලදී විද්‍යා හා තාක්ෂණික ආයතන 06 ක සමාලෝචන කටයුතු සිදු කළ යුතු වුවද වර්ෂය තුලදී ආයතන 03 ක පමණක් සමාලෝචන කටයුතු ආරම්භ කොට ඇති අතර අවසන් සමාලෝචන වාර්තා විගණිත දින වන 2017 මාර්තු 17 දින වන විටත් නිකුත් කොට නොතිබුණි.

(ආ) තරුණ විද්‍යාඥයින්ගේ පරිසංවාදයේ (Young Scientists Fova Symposium) 05 වන අදියර 2016 ජනවාරි 22 දින පවත්වා තිබූ අතර, එහිදී ප්‍රකාශයට පත් කරන ලද පර්යේෂණ වාර්තා සංඛ්‍යාව 35 ක් වූයෙන් එය ඉකුත් වර්ෂයේදී පවත්වන ලද 04 වන අදියරේ වාර්තා 51 ක සමඟ සසඳන කළ සියයට 31 කින් අඩු වී තිබුණි.

(ඇ) නොබැඳි ජාතීන්ගේ විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය (The Centre for Science and Technology of non-aligned and others developing countries) වෙත වාර්ෂික දායක ගාස්තුව ලෙස සමාලෝචිත වර්ෂය තුළදී රු. 2,936,533 ක මුදලක් ගෙවා තිබුණද, සමාලෝචිත වර්ෂය තුළදී එම මධ්‍යස්ථානය මගින් වැඩමුළු 06 ක් පවත්වා තිබූ නමුත් එයින් වැඩමුළු 03 ක් සඳහා පමණක් ශ්‍රී ලාංකික නියෝජිතයින් සහභාගී වී තිබුණි.

## 4.2 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

------------------------------------------

2006 ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 මාර්ගෝපදේශයට පටහැනිව සමාලෝචිත වර්ෂය සඳහා කොන්ත්‍රාත් වටිනාකම පිළිවෙලින් රු. 454,800 ක් හා රු.1,089,480 ක් වූ සනීපාරක්ෂක සේවාව හා ආරක්ෂක සේවාව සඳහා ලිඛිත ගිවිසුමකට එළඹීමකින් තොරව පෞද්ගලික ආයතන දෙකකින් අදාල සේවා ලබාගෙන තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

--------------------------------------

## 5.1 අභ්‍යන්තර විගණනය

----------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 133 (1) (අ) රෙගුලාසිය ප්‍රකාරව අභ්‍යන්තර විගණන කටයුතු කරගෙන යාම සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කර නොතිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණන කටයුතු අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක විසින් සිදුකර තිබුණද, මුදල් රෙගුලාසි 134 (3) අනුව ඔහු විසින් සිදුකරන ලද විගණන පරීක්ෂාවන්ට අදාල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 5.2 අයවැය ලේඛනමය පාලනය

-------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත වියදම්, තථ්‍ය වියදම් සමඟ සැසඳීමේදී අයිතමයන් 05 ක සියයට 50 සිට සියයට 100 දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරි වීම් නිරීක්ෂණය විය. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝජනය කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ප්‍රසම්පාදන පාලනය | විධිමත් කොන්ත්‍රාත් ගිවිසුම්වලට එළඹීමකින් තොරව සේවා ලබා ගැනීම. |
| (ආ) | අයවැය පාලනය | නිසියාකාරව ඇස්තමේන්තු සකස් නොකිරීම නිසා ප්‍රතිපාදන ඉතිරි වීම. |
| (ඇ) | කාර්ය මණ්ඩල පරිපාලනය | i. ආවරණය නොකල ප්‍රමාද වී පැමිණීම් සඳහා නිවාඩු ගණනය නොකිරීම.<br>ii. විද්‍යාත්මක කාර්ය මණ්ඩල තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම. |